# ගිනි කුහුඹු ආක්‍රමණය

> ගිනි කුහුඹුවා මහත්ම විනාශකාරී සතෙකි. මොවුහු උතුරු ඇමරිකානුවන්ට මහත් තර්ජනයක් වූහ. මෙම කෘමියා වැවිලි විනාශ කළේ ඒවායේ රසෝජාව උරා බීමෙනි.

දකුණු ඇමරිකානු භයානක ගිනි කුහුඹු හමුදවක් වරක් උතුරු ඇමරිකාවට ඉතා දරුණු ආක්‍රමණයක් එල්ල කළහ. මේ විනාශකාරී ගිනි කුහුඹුවන් තමන්ගේ ව්‍යාප්තියේදී දකුණේ සරු ගොවි බිම් වලින් බොහොමයක් කා දමා තිබුණි. මේ දරුණු ආක්‍රමණය නොනැවත්වූයේ නම් එය කැනඩාවෙන් ඔබ්බට පවා විහිද යන්නට තිබුණි.

ගිනි කුහුඹුවා මහත්ම විනාශකාරී සතෙකි. මොවුහු උතුරු ඇමරිකානුවන්ට මහත් තර්ජනයක් වූහ. මෙම කෘමියා වැවිලි විනාශ කළේ ඒවායේ රසෝජාව උරා බීමෙනි.

මූල් , තටු හා අනෙකුත් කොටස්වල ද ගෙඩිවල ද රසෝජාට උරා බීමෙන් ඌ පැළෑටි සම්පූර්ණයෙන්ම විනාශයට භාජනය කළේ ය. ඒ කුහුඹුවාට නම යෙදී ඇත්තේ ද ගිනි සැරයක් වන් උගේ දෂ්ඨ කිරීමට අනුව යි. විනාශකාරී ගිනි කුහුඹු මාරයාට අලුත උපන් වසු පැටවුන් හා ඌරන් ද මරා දමන්නට පුළුවන. ඔවුහු බිත්තර රකිනා කිකිළියන්ට ද හානි කර වූහ.

බිත්තර හා පොළවේ කුඩු තනා ගෙන ජීවත් වන්නාවූ කුරුල්ලන්ට ද ගිනි කුහුඹුවා හානි කර වූ අතර උන් ගේ බලකොටුවත් බඳු උස තුඹස අඩියේ සිට යාරය දක්වා උස් වූවක් විය. මොහු ගොවීන්ට ද ප්‍රචණ්ඩ ලෙස පහර දෙන්නට තරම් සාහසික වූහ. මේ කුඩා කුහුඹුවා දෂ්ඨ කරන අන්දම පුදුමාකාර ය. ඌ පළමුවෙන්ම පහර දෙනු ලබන්නා ගේ සම වික යි. ඉක්බිති ඒ තුවාලයට උගේ බඩ හේත්තු කොට තම අඬුවල ආධාරයෙන් ඉතා වේගයෙන් කරකැවෙයි. ඒ ක්‍රියාව කෙළවර වන විට විෂ ශරීරගත වී අවසාන ය. සාමාන්‍යයෙන් මේ දෂ්ඨ කිරීම ක්ෂණික වේදනාවක් දනවයි. කුරුලෑ බඳු සැරව සහිත කුඩා බිබිලි නගයි. දින කිහිපයකින් අවසන්වන සුළු වේදනාවක් ගෙන දෙන මෙම දෂ්ඨ කිරීම කලාතුරකින් මරණයෙන් ද කෙළවර වන තරමට භීෂණ ය .

මේ ගිනි කුහුඹු වසංගතය ගොවීන්ට මහත් තර්ජනයන් විය. ඔවුන්ගෙන් දැඩි ලෙස පහර දෙන ලද ඇලබාමා ප්‍රදේශයේ පාඩුව ඩොලර් ලක්ෂ 25 ක්ද ඉක්මවා ගියේ ය. මේ කුහුඹුවෝ ඇමරිකාවේ ලක්ෂ 27 ක් පමණ ව්‍යාප්ත වූහ. පළමු වරට ගිනි කුහුඹුවන් එක්සත් ජනපදයට ඇතුළු වූයේ 1918 දී පමණ දකුණු ඇමරිකානු පලතුරු බෝට්ටුවක මාර්ගයෙන් ඇලබාමාව හරහා බව විශ්වාස කරති. 1937 දී පමණ මොවුන් ගැන දැන ගන්නට ලැබී විෂ යෙදීමෙන් පැතිරීම වළක්වන ලදි.

එහෙත් පසුව ඔවුහු වෙනත් ප්‍රදේශවල පැතිර ගියහ. ඇලබාමා හි මධ්‍යම ගොවි පළක් පවත්වා ගෙන ගිය ඒ.ඩබ්ලිව්.ඩේලි නැමැත්තෙකුට තම ගොවි පළෙහි ගිනි කුහුඹු ගුහා 18 ක් තිබී සොයා ගනු හැකි විය.

මෙය ක්‍රමයෙන් වැඩි වී ගොස් 1957 වැසි මාසයේදී විස්ස පනහ ආදී වශයෙන් අක්කරයකට සියය පමණ බැගින් ඇති විය. ඇලබාමාහි පොලිටෙක්නික් ආයතනයේ ක්ෂුද්‍ර සත්ත්ව විද්‍යඥයකු වූ ඩබ්ලිව්. ඒ. රපින් මහතා මේ පිළිබඳව දැඩි ලෙස පරීක්ෂණ පැවැත්වූයේ ය. ඔහු ගිනි කුහුඹුවන්ගේ සැම විශාල ජනපදයක්ම ලිංගික වශයෙන් නොවැඩුණු ගැහැණු සේවිකාවෝ 25000 ක් පමණ සිටිති. 250 ක් පමණ පියාපත් සහිත රැජිනියක් ද සිටින අතර ඊට වඩා වැඩි ගණනක් පිරිමි කුහුඹුවෝ ද වෙති.

කුහුඹු රැජින අහසෙහි දී ( ඉගිල යාමේදී ) පිරිමි කුහුඹුවන් හා හැසිරෙයි. එම හැසිරීමෙන් පසුව වෙන් වෙන් ස්ථානවලට බසින රැජිනියෝ තම පියාපත් හැර දමා ගුහා පිහිටුවා ගනිති.

මේ හැරෙන්නට එම රැජිනන් සුළඟින් ඈත පෙදෙස් වලට ගසා ගෙන යාම ද සිදුවෙයි. ඒ හැර කාර්, දුම්රිය, ට්‍රක්රථ, නැව් ආදියෙන් ද ඈත පෙදෙස්වලට සංක්‍රමණය වන අතර කොහි හෝ බිමක ගුහා හාරා බිත්තර දැමීම ද කෙරෙයි. මේ ශීඝ්‍ර ව්‍යාප්තිය නිසා ගිනි කුහුඹු වසංගතය ඉතා භයානක තර්ජනයක් වූ බව පෙනේ. මෙම භයානක ගිනි කුහුඹු ආක්‍රමණය මැඩලන ලද්දේ විෂ වර්ගයක් යෙදීමෙනි. මේ අනුව ඔවුන් විශාල වශයෙන් විනාශවී ගිය අතර ව්‍යාප්තිය ද ඇන හිටියේ ය.

එහෙත් පසුව කරන ලද පර්යේෂණ වලින් එළිදරව් වූයේ සමහර ප්‍රදේශ වලදී ගිනි කුහුඹුවා අනෙක් විනාශකාරී කෘමීන් කා දමන ගොවියාගේ හිත මිතුරෙකු බවයි. ❑

**සුමිත් වීරතුංග**